# ආර්ථික ප්‍රතිසංස්කරණ දර්ශකය

## විධායක සාරාංශය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සෝෂල් ඉන්ඩිකේටර්
FRIEDRICH NAUMANN FOUNDATION FOR FREEDOM

සැප්තැම්බර් 2023

# හැඳින්වීම

ඉතිහාසයේ මෙතෙක් රට අත්විඳින ලද දරුණුතම ආර්ථික අර්බුදයෙන්, ආර්ථිකය යථා තත්වයට පත් කිරීම සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ රජය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර වසරක පමණ දීර්ඝ ද්විපාර්ශ්වික සාකච්ඡාවලින් පසුව, දෙපාර්ශවයම එක්ව කටයුතු කිරීමට එකඟතාවකට පැමිණියහ. මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස, ජාත්‍යන්තර මුල්‍ය අරමුදලෙහි පාලන විනිශ්චය කිරීමේ ප්‍රයත්නය පදනම් කරගෙන මෙහෙයවනු ලබන ප්‍රතිපත්ති වෙනස්කම්/ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සඳහා වූ යෝජනා සමඟින් ශ්‍රී ලංකාවට 2023 මාර්තු මාසයේදී ජාත්‍යාන්තර මුල්‍ය අරමුදල වෙතින් පළමු වාරිකය ලෙස ඩොලර් බිලියන 2.9 ක ණය පහසුකමක් ලැබුණි. මෙම සන්දර්භයේ, වත්මන් ආර්ථිකය සහ පසුගිය මාස කිහිපය තුළ ආරම්භ කරන ලද හෝ සාකච්ඡා කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන මතය විමසා බැලීමට ආර්ථික ප්‍රතිසංස්කරණ දර්ශකයේ දෙවන අදියරෙහි[1] දීපව්‍යාප්ත සමීක්ෂණය පවත්වන ලදී.

මෙම සමීක්ෂණය පවත්වන ලද්දේ, 1999 සිට ශ්‍රී ලංකාවේ පුළුල් පරාසයක සමාජ-දේශපාලනික ගැටළු පිළිබඳව මහජන මත විමසුම් පවත්වනු ලබන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි සමීක්ෂණ පර්යේෂණ අංශය වන සොෂල් ඉන්ඩිකේටර් (SI) විසිනි. සමීක්ෂණ පර්යේෂණ කණ්ඩායම ආචාර්ය ප්‍රදීප් පීරිස්, එම්. ක්‍රිෂ්ණමූර්ති, ඉෂාරා ජයරත්න සහ නිෂාරා කරුණාතිලක යන අයගෙන් සමන්විත විය. මේ ආකාරයේ අධ්‍යයනයක් මෙරට තුළ සිදු කිරීම සඳහා ලබා දුන් සහයෝගයට අපි ආචාර්ය පාක්‍යාසෝති සරවනමුත්තුට (CPA) සහ වුල්ෆ්ගැන්ග් හෙයින්ස් (Wolfgang Heinze) මහතාට සහ Friedrich Naumann Foundation for Freedom (FNF) හි ශ්‍රී ලංකාවේ කණ්ඩායමට ස්තූතිවන්ත වන්නෙමු.

1 ආර්ථික ප්‍රතිසංස්කරණ දර්ශකයේ පළමු අදියරෙහි වාර්තාව - https://www.cpalanka.org/wp-content/uploads/2022/11/Economic-Reform-Index_Topline-Report_ENGLISH.pdf

# ක්‍රමවේදය

ආර්ථික ප්‍රතිසංස්කරණ පිළිබඳ දර්ශකය - දෙවන අදියරෙහි සමීක්ෂණය අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙන් (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) ප්‍රතිචාර දැක්වූවන් 1000ක් සමඟ සිදු කරන ලදී. තවද, නියැදිය සියලුම දිස්ත්‍රික්ක 25 තුළ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ස්ත්‍රීන් සහ පුරුෂයන්ගෙන් සමන්විත විය. ක්ෂේත්‍ර කටයුතු සඳහා ක්ෂේත්‍ර සමීක්ෂකයන් 77ක් (ස්ත්‍රී සහ පුරුෂ) සහභාගී විය. මෙම ප්‍රතිචාර දැක්වූවන් අහඹු නියැදී ක්‍රමවේදය භාවිතා කරමින් තෝරා ගන්නා ලද අතර, නියැදි ස්ථාන තෝරා ගැනීම සඳහා බහු-අදියර අහඹු ස්ථර නියැදි තාක්ෂණය භාවිතා කරන ලදී. මෙම ජාතික මත විමසුම සඳහා ක්ෂේත්‍ර කටයුතු 2023 අගෝස්තු 21 දින සිට 29 දින දක්වා පවත්වන ලදී. ජනගහනයේ සැබෑ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජ විද්‍යා සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත කට්ටලය විශ්ලේෂණය කරන ලදී.

# විධායක සාරාංශය

**ආර්ථික තත්ත්වය වසරකට පෙර පැවති තත්වය සමඟ සැසඳීම**

- වසරකට පෙර හා සසඳන විට තම ආර්ථික තත්ත්වය නරක අතට හැරී ඇති බව පවසන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රතිශතය 2022 ඔක්තෝම්බර් මාසයේදී 79% සිට 2023 අගෝස්තු මාසයේදී 62% ට අඩු වී ඇත.
- නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ සංසන්දනය කිරීමේදී, නාගරික ප්‍රදේශවලින් අතිමහත් ප්‍රතිශතයක් (81%) ද ග්‍රාමීය ප්‍රදේශවලින් 58% ක් ද තමන් ආර්ථික බරක් අත්විඳින බව ප්‍රකාශ කරයි.

**අනාගත ආර්ථික තත්ත්වය පිළිබඳ මතය**

- ආර්ථික අනාගතය සම්බන්ධයෙන් විමසීමේදී, පස් දෙනෙකුගෙන් දෙදෙනෙක් ආර්ථික තත්ත්වය නරක අතට හැරෙනු ඇතැයි ශුභවාදී නොවන අදහස් ප්‍රකාශ කරන අතර, ශ්‍රී ලාංකිකයන්ගෙන් හතරෙන් එකක් වසරක් ඇතුළත තම ආර්ථිකයේ වෙනසක් සිදු නොවනු ඇතැයි විශ්වාස කර යි.
- වයස අවුරුදු 30 හෝ ඊට වැඩි පුද්ගලයින්ට වඩා ආර්ථික තත්ත්වය සම්බන්ධයෙන් තරුණ තරුණියන් තුළ  තරමක් වැඩි ශුභවාදීත්වයක් පවතියි.
- වසරක් ඇතුළත තම ආර්ථිකය නරක අතට හැරෙනු ඇතැයි විශ්වාස කරන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රතිශතය ග්‍රාමීය ප්‍රදේශවලට (38%) වඩා නාගරික ප්‍රදේශවල (46%) වැඩිය.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහය පිළිබඳ මහජන මතය**

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහය පිළිබඳ ජනතාව එකිනෙකට වෙනස් මතයක් ප්‍රකාශ කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහය ශ්‍රී ලංකාවට වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට උපකාර වනු ඇතැයි ශ්‍රී ලාංකිකයන්ගෙන් 46%ක් පමණ විශ්වාස කරන අතරම එයට සමාන ප්‍රතිශතයක් අවිශ්වාසය ප්‍රකාශ කරයි.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහය වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට උපකාර වනු ඇතැයි වැඩිහිටියන් හා සසඳන විට (අවුරුදු 30 ට වැඩි), තරුණ තරුණියන් (අවුරුදු 18-29) අතර විශ්වාසය තරමක් ඉහළ ය.

### ආර්ථික අර්බුදයෙන් ගොඩඒමට ජාත්‍යන්තර සහාය

- වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩඒමට ශ්‍රී ලංකාවට සහය වන රටවල් ලෙස ඉන්දියාව, චීනය, ජපානය, ඇමරිකා එක්සත් ජනපදය සහ රුසියාව යන රටවල් අතරින් චීනය ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (38%) පළමුව ශ්‍රේණිගත කරන අතර, ඉන්පසුව ඉන්දියාව (22%) සහ ජපානය (18%) ශ්‍රේණිගත කරයි.

### ආර්ථික ප්‍රතිසංස්කරණ මෙහෙය වන පුද්ගලයන් පිළිබඳ මහජන විශ්වාසය

- වත්මන් ආර්ථික අර්බුදය ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් විසඳනු ඇතැයි ශ්‍රී ලාංකිකයන්ගෙන් 42%ක් පමණ විශ්වාස කරන අතරම ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩක් ප්‍රකාශ කරන්නේ එසේ නොවන බවයි.
- වත්මන් ආර්ථික අර්බුදය ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් විසඳනු ඇතැයි වැඩිහිටියන් (අවුරුදු 30 ට වැඩි) සහ තරුණ තරුණියන් (අවුරුදු 18-29) අතර විශ්වාසයහි සැලකිය යුතු වෙනසක් නැත.
- වත්මන් ආර්ථික අර්බුදය විසඳීම සඳහා නිවැරදි දේ කිරීමට මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහට ඇති හැකියාව පිළිබඳව ශ්‍රී ලාංකිකයන්ගෙන් 42%ක් පමණ විශ්වාසය ප්‍රකාශ කරන අතර ශ්‍රී ලාංකිකයන්ගෙන් 38%ක් ප්‍රකාශ කරන්නේ එසේ නොසිතන බවයි.
- වැඩිහිටියන් (අවුරුදු 30 ට වැඩි) සහ තරුණ තරුණියන් (අවුරුදු 18-29) අතර විශ්වාසයේ සහ අවිශ්වාසයේ ප්‍රතිශතය ආසන්න වශයෙන් සමානව බෙදී ඇත.

### මහජනතාවගේ වියදම් කිරීමේ හැකියාව

- ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් ආහාර, විදුලිය, සෞඛ්‍ය, දරුවන්ගේ අධ්‍යාපනය සහ විවේක, විනෝදාස්වාද කටයුතු සඳහා වියදම් කිරීමේ දුෂ්කරතා ඇති බව ප්‍රකාශ කර සිටිති.
- සැලකිය යුතු කරුණක් නම්, ආහාර සඳහා වියදම් කිරීමේ දුෂ්කරතා ඇති බව ශ්‍රී ලාංකිකයින්ගෙන් 83% ක් ප්‍රකාශ කරන අතර, සෞඛ්‍ය (87%), අධ්‍යාපනය (90%), විදුලිය (93%) සහ විවේක, විනෝදාස්වාද ක්‍රියාකාරකම් (94%) සඳහා වියදම් කිරීම ගැන විමසීමේදී, දුෂ්කරතා ඇති බව ප්‍රකාශ කළ ජනගහනයේ ප්‍රතිශතය වැඩි වේ.

### විදේශගත වීමට ඇති කැමැත්ත

- ශ්‍රී ලාංකිකයන්ගෙන් 68% කට ආසන්න ප්‍රමාණයක් ප්‍රකාශ කරන්නේ ශ්‍රී ලංකාව හැර ගොස් වෙනත් රටක ජීවත් වීමට තමන්ට අවස්ථාවක් ලැබුණහොත් විදේශගත වීමට කැමැත්තක් ඇති බවයි. 2022 ඔක්තෝබර් (57%) හා සසඳන විට මෙම කැමැත්තෙහි සුළු වැඩිවීමක් ඇත.

- වැඩිහිටියන් (අවුරුදු 30 ට වැඩි) සහ තරුණ තරුණියන් (අවුරුදු 18-29) යන වයස් කාණ්ඩ දෙකෙන්ම විදේශගත වීමට ඇති කැමැත්තෙහි වැඩි වීමක් නිරීක්ෂණය කළ හැකිය.
- තරුණ තරුණියන් (අවුරුදු 18-29) අතර විදේශගත වීමට ඇති කැමැත්ත 2022 ඔක්තෝම්බර් මාසයේදී 77% සිට 2023 අගෝස්තු මාසයේදී 82% දක්වා වැඩි වී ඇති අතර, වැඩිහිටියන් (අවුරුදු 30 ට වැඩි) අතර සමාන වැඩිවීමක් එනම් 45% සිට 59% දක්වා ඇති බව දැකිය හැක.

**දේශීය ණය ප්‍රශස්ත කිරීමේ (DDO) වැඩසටහන පිළිබඳ දැනුවත්භාවය සහ මහජන මතය**

- සැලකිය යුතු කරුණක් ලෙස, ශ්‍රී ලාංකිකයන්ගෙන් 30% ක් පමණක් දේශිය ණය ප්‍රශස්තකරණ (DDO) වැඩසටහන පිළිබඳව දැනුවත් බව ප්‍රකාශ කරන අතර, ශ්‍රී ලාංකිකයන්ගෙන් 70% ක් ඒ පිළිබඳ දැනුවත් නොවන බව ප්‍රකාශ කරයි.
- තමන් දැනුවත් බව ප්‍රකාශ කරන ශ්‍රී ලාංකිකයන් අතරින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කර ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා දේශිය ණය ප්‍රශස්තකරණ (DDO) වැඩසටහන රටට අත්‍යවශ්‍ය බවට වන ප්‍රකාශයට 70% ක් එකඟ වන අතර, දේශිය ණය ප්‍රශස්තකරණ වැඩසටහන බාහිර ණය සාකච්ඡා තරමක් පහසු කරන බවට වන ප්‍රකාශයට 63% ක් එකඟ වෙති. අනෙක් අතට, ඔවුන්ගෙන් 60% ක් පමණ විශ්වාස කරන්නේ දේශිය ණය ප්‍රශස්තකරණ වැඩසටහන විශ්‍රාමිකයාට අසමාන ලෙස බලපානු ඇති අතර EPF සහ ETF අරමුදලට ද අහිතකර ලෙස බලපානු ඇති බවයි.
- දේශිය ණය ප්‍රශස්තකරණ වැඩසටහන පිළිබඳ දැනුවත් නොවන පිරිසෙන් 62% ක් වත්මන් ආර්ථික අර්බුදය විසඳීමට අවශ්‍ය බව රජය ප්‍රකාශ කර ඇති බැවින් දේශිය ණය ප්‍රශස්තකරණ වැඩසටහන අනුමත කරයි.

**අස්වැසුම වැඩසටහන පිළිබඳ දැනුවත්භාවය සහ මහජන මතය**

- අතිමහත් බහුතරයක් අස්වැසුම වැඩසටහන පිළිබඳ දැනුවත් වේ. නාගරික ප්‍රදේශ (76%) හා සසඳන විට ග්‍රාමීය ප්‍රදේශ (85%) අතර මෙම දැනුවත්භාවය තරමක් වැඩි ය.
- අස්වැසුම පිළිබඳ දැනුවත් ශ්‍රී ලාංකිකයන් අතරින් 68% ක් සිතන්නේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය අපක්ෂපාති සහ සාධාරණ නොවන බවයි.
- අස්වැසුම පිළිබඳ දැනුවත් ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න පිරිසකගේ මතය වී ඇත්තේ වත්මන් ආර්ථික අර්බුදයට මුහුණ දීමට දිළිඳු ජනතාවට අස්වැසුම උපකාර වනු ඇති බවයි. එයට සමාන ප්‍රතිශතයක් විරුද්ධ මතයක් ද ප්‍රකාශ කරයි.

### දූෂණ විරෝධී පනත් කෙටුම්පත පිළිබඳ දැනුවත්භාවය සහ මහජන මතය

- 2023 ජූලි 19 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ දූෂණ විරෝධී පනත් කෙටුම්පත පිළිබඳ ජනගහනයෙන් බහුතරයකට (70%) දැනුවත්භාවයක් නැත. මෙම දැනුවත්භාවය නොමැතිකම වැඩිහිටියන් (අවුරුදු 30 ට වැඩි) සහ තරුණ තරුණියන් (අවුරුදු 18-29) යන දෙපිරිසෙන්ම සමානව දක්නට ලැබේ.
- දූෂණ විරෝධී පනත් කෙටුම්පත පිළිබඳව දැනුවත් ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (56%) විශ්වාස කරන්නේ මෙම පනත කිසිසේත්ම දූෂණය අවම කිරීමට කිසිදු බලපෑමක් නොකරන බවයි. මෙම මතය වැඩිහිටියන්ගෙන් 60% (අවුරුදු 30 ට වැඩි) සහ තරුණ තරුණියන්ගෙන් 50% (අවුරුදු 18-29) විසින් දරන මතය වේ.

### ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති යෝජනාවන් කෙරෙහි ආකල්පය

- ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති යෝජනාවන් පිළිබඳ සමීක්ෂණ සොයාගැනීම්වලට අනුව, ශ්‍රී ලාංකිකයින්ගෙන් 54%කගේ මතය වී ඇත්තේ, ව්‍යාපාර වැඩි වීම තුළින් සියලුදෙනාටම වාසි සැලසෙන නිසා විදේශීය සමාගම්වලට අපේ රටේ ආයෝජනය කිරීමට රජය ඉඩ දිය යුතු බවයි. එමෙන්ම 33%ක් පෙන්වා දෙන්නේ ව්‍යාපාර පවත්වාගෙන යාම රජයේ වගකීමක් නොවන බැවින් රාජ්‍ය සංස්ථාවන් පෞද්ගලීකරණය කළ යුතු බවයි. රජය පුද්ගලයෙකුගේ ඉපැයීමේ හැකියාව සීමා නොකළ යුතු බව 70% ක් පමණ ප්‍රකාශ කරයි. මෙම මතයන් 2022 ඔක්තෝම්බර් මාසය සමඟ සංසන්දනය කිරීමේදී සැලකිය යුතු වෙනස්කමක් දක්නට නැත.

### සුබසාධන ප්‍රතිපත්ති යෝජනාවන් පිළිබඳ මහජන මතය

- සුබසාධන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විමසීමේදී, ජනගහනයෙන් අඩකට ආසන්න පිරිසක් සිතන්නේ රජයේ වියදම් අඩු කිරීම සඳහා රජයේ සේවක සංඛ්‍යාව අඩු කළ යුතු බවයි.
- සමාන ප්‍රතිශතයක ශ්‍රී ලාංකිකයන් 2022 ඔක්තෝම්බර් මාසයේදී ද මෙම මතය දරා ඇත. කෙසේ වෙතත්, 64% විශ්වාස කරන්නේ තම ජනතාව රැකබලා ගැනීම සහ සුබසාධන වැඩසටහන් සඳහා වියදම් කිරීම රජයේ වගකීමක් බවයි. 2022 වසරෙහි ඔක්තෝම්බර් මාසයේ මෙම විශ්වාසය 56% ක් ව පැවැති අතර මෙම වසර වන විට වැඩි වී ඇත.

1958 දී ජර්මන් ජනරජයේ ප්‍රථම ජනාධිපති තියඩෝර් හියුස් විසින් Friedrich Naumann Foundation for Freedom පිහිටුවන ලදී. මෙම සංවිධානයේ අරමුණ වන්නේ ජර්මනියේ සහ විදේශයන්හි සිටින සියලුම මිනිසුන්ගේ සහ සමාජයේ සෑම අංශයකම ගෞරවය සඳහා නිදහසේ මූලධර්මය සහතික කිරීමේ ඉලක්කය ප්‍රවර්ධනය කිරීමයි. අපගේ වැඩ කටයුතු සඳහා අරමුදල් සපයනු ලබන්නේ ෆෙඩරල් ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන අමාත්‍යාංශය හරහා ජර්මානු පාර්ලිමේන්තුව, විදේශ කාර්යාලය සහ වැඩි වශයෙන් යුරෝපීය සංගමය මඟිනි. Friedrich Naumann Foundation for Freedom ලොව පුරා රටවල් 60කට අධික සංඛ්‍යාවක ක්‍රියා කරයි. දකුණු ආසියාවේ; ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය සහ ශ්‍රී ලංකාවේ FNF කාර්යාල ඇත. මීට අමතරව නේපාලය, භූතානය සහ මාලදිවයිනේ හවුල්කරුවන් සමඟ FNF කටයුතු කරයි. Friedrich Naumann Foundation for Freedom සංවිධානය ශ්‍රී ලංකාව සමඟ ඇති සම්බන්ධය දශක පහක් පැරණි ය. 1968 සිට 2013 දක්වා කාලය තුළ සහ 2016 දී එහි වැඩ කටයුතු නැවත ආරම්භ කිරීමෙන් පසු සංවිධානයේ කාර්යය නිදහස සහ වගකීම පිළිබඳ මූලික වටිනාකම් කෙරෙහි අවධානය යොමු කරයි.

FRIEDRICH NAUMANN FOUNDATION For Freedom.
Sri Lanka

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයක් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනයඃ නො. 6/5, ලේයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථනඃ +94 11 208134/ +94 11 208135 / +94 11 208136
ෆැක්ස් - +94 (11) 208138
වෙබ්ඃ www.cpalanka.org
විද්‍යුත් තැපැල - info@cpalanka.org

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

25 YEARS 1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමඟින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනයඃ නො. 6/5, ලේයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථනඃ +94 11 2584050
වෙබ්ඃ www.cpalanka.org.survey-research
විද්‍යුත් තැපැලඃ krishna@cpasocialindicator.org

Making Social Research Count